**මතුගම ප්‍රාදේශීය සභාව - 2021**

**----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**--------------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**--------------------------------**

මතුගම ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**--------------------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**----------------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරුකිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසාවන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම**

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රමිතයේ 3.13 වගන්තිය ප්‍රකාරව විස්තීර්ණ ආදායම් ප්‍රකාශය පිළියෙල කළයුතුඅතර ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ හෙළිදරව් කළයුතු අතිරික්තයේ හඳුනානොගත් ප්‍රාග්ධන වියදම් රු.17,804,230 ක්, අතිරික්තයේ හෝ ඌණතාවයේ හඳුනා නොගත් ප්‍රාග්ධන වියදම් ලෙස දක්වා නොතිබුණි.<br><br>(ආ) ප්‍රමිතයේ 3.16 වගන්තිය ප්‍රකාරව වාර්තා කරනු ලබන කාල පරිච්ඡේදයේ අවසාන දිනට අස්ථිත්වයේ පවතින වත්කම් වගකීම් සියල්ල වත්කම් හා වගකීම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවද, 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වාම මෙතෙක් වටිනාකම් හඳුනානොගත් සභාවෙන් ඉවත් කළ ලිබඩු, කාර්යාල උපකරණආදි වත්කම් වල වටිනාකම් පොත්වලින් ඉවත් නොකර වත්කම්වල අගය දක්වා තිබුණි.<br><br>(ඇ) ප්‍රමිතයේ 3.26 වගන්තිය ප්‍රකාරව සකස් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| • මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය ගණනය කිරිමේදී වර්ෂයේ පොලි ආදායම රු.1,532,506 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එම අගය රු.2,738,431 ක් ලෙස දැක්වීමෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ශේෂය රු.1,205,925 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>• සමාලෝචිත වර්ෂය තුලස්ථාවර වත්කම් මිලට ගැණුම් රු.11,245,622 වුවද එම අගය රු.26,960,859 ක් ලෙස දැක්වීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් වලින් පිටතට ගලාගිය ශුද්ධ මුදල් ප්‍රවාහය රු.15,715,237 ක් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>• සමාලෝචිත වර්ෂය තුල ලැබුණු පොලී ආදායම රු.1,532,506 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ පොලි ආදායම ලෙස දැක්විය යුතු වුවද, එම අගය මුදල් ප්‍රවාහයේ දක්වා නොතිබීමෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ ලැබුණු පොලිය රු.1,532,506 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>• වර්ෂයේ ලැබුණු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.17,804,231 ක් වුවද, එම අගය මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා නොතිබීමෙන් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ ලැබීම් එම අගයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**1.6.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය තුල ජායා පිටපත් යන්ත්‍ර 03 ක් සේවා කිරිම සඳහා රු.59,870 ක් වැයකර සේවා ගිවිසුම් අත්සන් කර තිබුණද එම මුදලින් ඉදිරි වර්ෂයට අදාල රු.29,641 ක් කලින් ගෙවීම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.<br><br>(ආ) 2020 වර්ෂයේදී ලැබි තිබු ප්‍රාග්ධන වියදම් ප්‍රදාන රු.81,276,398 ක්, යොදා ලබාගත් වත්කම්වලට අදාල ක්ෂය ප්‍රතිශතයට සමාන වටිනාකම රු.8,128 ක් සමාලෝචිත වර්ෂයේ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අයභාරය යටතේ පුනරාවර්තන නොවන වියදම් සඳහා රජයෙන් කල මාරු කිරිම් ලෙස සටහන් කර නොතිබු බැවින් වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) 2020 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් වාර්තාවට අනුව සමස්ථ හිඟ ආදායම රු.8,963,068ක් 2021 ජනවාරි 01 දිනට ඉදිරියට ගෙන යාමේදීරු.8,660,801 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වරිපනම් රු.302,267 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>(ඈ) සමාලෝචිත වර්ෂය තුල පොත් අගය රු.100,000 ක් වූ දිප්පිට සුසානභූමියේ සොහොන්ගෙය කඩා ඉවත් කර තිබුණද එම වටිනාකම පොත්වලින් ඉවත් නොකිරීමෙන් 2021 දෙසැම්බර් 31දිනටදේපල පිරියත වටිනාකම රු.100,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(ඉ)2021 දෙසැම්බර් 31 දිනට රු.100,000 වටිනාකමක් සහිත බෝදරගම පාර්ක් පොදු ඉඩම රු.2,000,000 ක් ලෙස ගිණුමේ දැක්වීමෙන් දේපල, පිරියත හා උපකරණ රු.1,900,000 ක් වැඩියෙන් දක්වා තිබුණි.<br><br>(ඊ) වෙනත් විස්තීර්ණ ආදායම් රු.17,804,230 ක් සහ වර්ෂයේ අතිරික්තය රු.26,494,865 ක් වූයෙන් වසර සඳහා විස්තීර්ණ ආදායම රු.44,299,095 ක් විය යුතු වුවද, එම අගය රු.35,608,461 ක් ලෙස දැක්වීමෙන් වසර සඳහා විස්තීර්ණ ආදායම රු.8,690,634 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>(උ) සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය කිරීමේ අනුපාතයන් අනුව වර්ෂයේ ආදායමට එරෙහිව කපා හැරිය යුතු රු.14,590,027 ක ක්ෂය වියදම ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා**

| විෂයය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 11 කට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම හා ඊට අනුරූපී වාර්තාවල දැක්වෙන වටිනාකම අතර රු.41,653,801 ක වෙනසක් විය. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව | මූල්‍ය ප්‍රකාශන ශේෂ හා උපලේඛන ශේෂ සමාන විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ අතිරික්තය රු.26,494,865 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ අතිරික්තය රු.79,856,740ක් විය.

## 2..2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

--------------------------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වරිපනම් බදු හිඟයෙන් වසර 01- 03 අතර කාලයක සිට අයවිය යුතු රු.4,290,926 ක් ද, වසර 03- 10 ත් අතර කාලයක සිට අයවිය යුතු රු.1,523,774 ක් විය. | 2022 සැප්තැම්බර් 30 දිනට හිඟයෙන් රු.741,081 ක් අය වී ඇති බව | හිඟ වරිපනම් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුව විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 වත්කම් කළමනාකරණය

----------------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොත් වටිනාකම රු.12,500,000 ක් වූ අක්කර 12 යි රූඩ් 02 යි පර්චස් 36 කින් යුත් බටමුල්ලකන්ද ඉඩම 2012 අගෝස්තු 21 දින මැණුම් කිරිමේදී රාජ්‍ය ආයතනයකින් , විහාරස්ථානයකින් සහ නිවාස හිමියන් තිදෙනෙකු විසින් රූඩ් 02 පර්චස් 12.72 ක ඉඩම් ප්‍රමාණයක් අත්පත් කරගෙන තිබුණි. වසර 04 කට පසු 2016 නොවැම්බර් මාසයේදී එම කොටස නැවතත් සභාවට බාරදෙන ලෙස රාජ්‍ය ආයතන සහ පුද්ගලයන්ට දැනුම්දීම පමණක් සිදුකර තිබුණද 2022 අගෝස්තු 23 වන විටද එම ඉඩම සභාවට අත්පත් කර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර මෙම ඉඩමේ අක්කර 12 යි පර්චස් 23 ක ප්‍රමාණය සභාව විසින් භාවිතයට ගැනීමෙන් තොරව ඌණ උපයෝජිතව පවතින බවට නිරීක්ෂණය විය. | වනෝද්‍යානයක් ලෙස සංවර්ධනය කිරිමට නාගරික සංවර්ධන අධිකාරිය යෝජනා කර ඇති බව | සභාව සතු ඉඩම් වල අයිතිය කහවුරු කරගෙන ඵලදායි කාර්යයකට යොදාගත යුතුය. |
| (ආ) පොත් වටිනාකම රු.20,000,000 ක් වූ අක්කර 07 ක් රූඩ් 01 ක් සහ පර්චස් 11.4 කින් යුත් මතුගම වත්ත ඉඩමේ අනවසර නිවාස ඉදිකර තිබුණ අතර ඒ සම්බන්ධයෙන් සභාව කටයුතු කර නොතිබුණි. තවද මෙම භූමියේ සභාවට කිසිඳු ගාස්තුවක් ගෙවීමකින් තොරව විදේශ සේවා නියුක්ති කාර්යාංශ ගොඩනැගිල්ල ඉදිකර තිබුණද එම ආයතනයෙන් සභාවට බදු ගෙවීමක් නොකරන බවට නිරීක්ෂණය විය. පශු වෛද්‍ය කාර්යාලයද මෙම භූමියේද ඉදිකර තිබුණද එම ආයතනයෙන්ද බදු අයකිරිමක් සිදු නොවන බවට නිරීක්ෂණය විය. | කළුතර දිසාපති විසින් 1962 දි මතුගම සුළු නගර සභාව වෙත පැවරූ ඉඩමකි. එවකට එහි සේවය කළ අයට පදිංචියට ඉඩදී ඇත. 2003 සිට වසර 05 ක් සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය බදු ගෙවා ඇත. ඉන් පසුව නැති බවත්, අමාත්‍ය මණ්ඩල තීරණයක් මත ඉඩම් කොටස විදේශ සේවා නියුක්ති කාර්ාංශයට ලබාදී ඇත. | සභාව සතු ඉඩම් නිවැරදිව හඳුනාගෙන ලේඛනගත කළ යුතුය. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවට අයත් පර්චස් 08 ක ඉඩම් කැබලි 04 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේදී නිවැරදි කරන බව. | සභාව සතු ඉඩම් තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කළයුතුය. |